# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 1 දරන රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 ජනවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 ජනවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2012 අංක 1 දරන රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 ජනවාරි මස 17 වැනි දින]

එල්.ඩී.ඕ.—අයි.එන්. සී. 18/2010.

**රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව)" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා (123 වන අධිකාරය වූ) සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කර තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී සමිතිය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2012 අංක 1 දරන රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) හි දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව)" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) සංස්ථාගත කිරීම.

2—PL005067—2,590(2010/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) හින්දු ජන සමාජයේ ශ්‍රී රාමක්‍රිෂ්ණ පරමහම්ස, ශ්‍රී සාරදා දේවි සහ ස්වාමි විවේකානන්ද ඉගැන්වීම් සහ හින්දු ආගමික අධ්‍යයන සහ එහි ධර්ම ග්‍රන්ථ ඉගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) සංසන්දනාත්මක දේවවාදය පුළුල් ලෙස අධ්‍යයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සියලු ආගම් අතර සහජීවනය ඇති කිරීමට සහාය වීම;

(ඇ) හින්දු කාන්තාවන් සහ ළමයින් අතර ආගමික, අධ්‍යාපනික, සමාජයීය සහ සංස්කෘතික දියුණුව ප්‍රවර්ධනය කිරීම, දිරිමත් කිරීම සහ සහාය වීම;

(ඈ) හින්දු ප්‍රජාව සඳහා ආගමික සහ අධ්‍යාපනික ආයතන, අනාථ නිවාස, විද්‍යාගාර, ආරෝග්‍ය ශාලා, බෙහෙත් ශාලා සහ අනෙකුත් පුණ්‍ය ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම;

(ඉ) හින්දු ආගමික ආයතනවල සිටින ගුරුවරුන් පුහුණු කිරීම සහ දැනුම සම්බන්ධ අංශවල සිටින ජනයා අතර අධ්‍යාපනික ක්‍රියාකාරකම් කරගෙන යාම;

(ඊ) සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලැබිය හැකි පොත්, ජර්නල, වාරික සහ සඟරා මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මගින් මුද්‍රණය කොට පළ කිරීම සහ බෙදා හැරීම;

(උ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හින්දු ආගමිකයන් සඳහා සම්මන්ත්‍රණ, සම්මේලන, දේශන, වැඩමුළු සහ කණ්ඩායම් අධ්‍යයන පැවැත්වීම සහ ඒවාට අනුග්‍රහය දැක්වීම; සහ

(ඌ) හින්දු ප්‍රජාවගේ යහපත සඳහා සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති, දේශීය හෝ විදේශීය ආයතන හෝ සංවිධාන සමඟ සහයෝගීතාවෙන් කටයුතු කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු කල්කටා, දක්ෂිනේෂ්වර්හි රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙයේ පාලක මඬුල්ල විසින් නම් කරනු ලබන සභාපතිවරයකුගෙන් හා ලේකම්වරයකුගෙන් ද, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හෝ පත් කරගනු ලබන උපසභාපති සහ වෙනත් ධුර දරන්නන්ගෙන් ද සමන්විත, (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක කමිටුවක් විසින්, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) තත්කාලයේ කල්කටා, දක්ෂිනේෂ්වර් හි රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙයේ සභාපති පදවිය දරන තැනැත්තා, සංස්ථාවේ අනුශාසක විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ විධායක කමිටුවේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් එක් පරමාර්ථයක් වැඩිදියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින් ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඈ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම;

(ඇ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම සහ ඔවුන් සේවයෙන් නෙරපීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුර දරන්නන්ගේ ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය ;

(ඇ) කමිටුවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) සංස්ථාවේ සහ කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ සංස්ථාවේ සහ කමිටුවේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව, ඒ පිළිබඳ දැන්වීම් සහ ඒවායේ ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය සහ එහි අරමුදල් භාරව සිටීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම, (1) වන උපවගන්තිය යටතේ එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයට සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු, ප්‍රදාන හෝ මූල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින් මතු සංස්ථාවට ලැබෙන හෝ සියලු මුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය හා ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, කමිටුව විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ කමිටුව විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ඔවුන් විසින් තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය මුදල්.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතිය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය, සමිතියට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිදු සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ සාමාජිකයාගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

12. කවර ආකාරයෙන් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපල මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එහි යම් කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත ඍජුව ම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් දෙයක් වශයෙන් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

13. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන චංචල හෝ නිශ්චල දේපල අත් කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ලාභයක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ඉතිරි කිරීම්.

16. (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව සමිතිය විසින් හෝ සමිතිය වෙනුවෙන් සාදන ලද, නිකුත් කරන ලද හෝ ක්‍රියාත්මක කරන ලද කවර ආකාරයේ හෝ සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම්, සහතික හෝ වෙනත් යම් සාධන පත්‍ර හෝ ලේඛන, මේ

පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට සහ ඉන් පසු දිනයක සිට සංස්ථාව විසින් හෝ වෙනුවෙන් සාදන ලද, නිකුත් කරන ලද හෝ ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්, ගිවිසුම්, සහතික හෝ වෙනත් යම් සාධන පත්‍ර හෝ ලේඛන ලෙස සැලකිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම අවසන් නොවී පවතින සමිතිය විසින් පවරන ලද හෝ ඊට එරෙහිව පවරන ලද සියලු නඩු කටයුතු, අභියාචන හෝ වෙනත් යම් නීති කටයුතු, නතර වීමක් හෝ ඛණ්ඩනය වීමක් සිදු නොවිය යුතු අතර, නොකඩවා, සංස්ථාව විසින් හෝ ඊට එරෙහිව බලාත්මක විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී සමිතිය වෙත පැවරුණ හෝ නීත්‍යනුකූලව සමිතිය විසින් මිළ දී ගන්නා ලද හෝ අත්පත් කර ගන්නා ලද හෝ බදු දෙන ලද හෝ සමිතිය වෙත වෙනත් යම් ආකාරයකින් පවරන ලද හෝ සමිතිය සඳහා භාරයක් ලෙස දරන ලද යන ආකාරවලින් සමිතිය සන්තකයේ හෝ පාලනයේ තිබූ සියලු චංචල සහ නිශ්චල දේපල, ඒ දේපල එදින දී යටත්ව තිබූ භාර, අය කිරීම්, වගකීම්, වෙන් කිරීම්, පරවශ්‍යතා හෝ වෙනත් යම් වගකීම් සහ ඒ සම්බන්ධයෙන් වූ හෝ ඊට බලපෑ යම් කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංස්ථාව විසින් දැරිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් හැර මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සමිතියේ අනෙකුත් සියලු අයිතිවාසිකම්, වගකීම් හා බැඳීම්, සංස්ථාවේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.